JMC vLearning
"your virtual learning partner"

# විගණන ලේඛනගත කිරීම
# (SLAuS 230)

## AAT අදියර III
### FCA - මූල්‍ය පාලනයන් හා විගණනය

ජීවන්ත පෙරේරා
B.Sc. (Accountancy) Sp., ACA, Reading for MBA (Cardiff Metropolitan-UK)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය Estd. 1972
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## විගණන ලිපි ලේඛණ / විගණන කාර්යය පත්‍රිකා – (S.L.Au.S.230)

- හැඳින්වීම
- විගණන ලිපි ලේඛණ යනු කුමක්ද ?
- විගණන ලිපි ලේඛණවල අඩංගු විය යුතු කරුණු
- විගණන ලිපි ලේඛණ වලින් ඇති ප්‍රයෝජන
- කොතෙක් දුරට ලිපි ලේඛණ ගත කළ යුතුද ?
- විගණන ලිපි ගොනු

## හැඳින්වීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අංක 230 ට අනුව විගණක විසින් විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුව සිදු කළ බවත්, විගණන මතය තහවුරු කිරීම සඳහා වැදගත් වන සාක්ෂි ලබා දෙන කරුණු ලේඛණ ගත කිරීම සිදු කළ යුතුය.

## විගණන ලිපි ලේඛණ යනු කුමක්ද ?

"විගණක අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි, එමගින් ලබාගත් විගණන සාක්ෂි හා විගණක එළඹි නිගමනයන් වාර්තා කර ඇති"

a) විගණක විසින් පිළියෙල කරන ලද

b) විගණක වෙනුවෙන් ව්‍යාපාර විසින් පිළියෙල කරන ලද

c) විගණක වෙනුවෙන් තෙවන පාර්ශවයන් පිළියෙල කරන ලද

විගණක ලබා ගන්නා හා තබා ගන්නා කාර්යය පත්‍රිකාවන් විගණන ලිපි ලේඛණ ලෙස හඳුන්වයි"

## විගණන ලිපි ලේඛණවල අඩංගු විය යුතු කරුණු

- විගණනය සැලසුම් කිරීමට අදාළ වන කරුණු
- ක්‍රියාත්මක කරන ලද විගණන ක්‍රියාපටිපාටි වල ස්වභාවය කාලය හා තරම
- සිදු කරන ලද ක්‍රියාපටිපාටි මගින් ලද ප්‍රතිඵල / සාක්ෂි
- එම ප්‍රතිඵල මත එළඹි නිගමනයන්

## විගණන ලිපි ලේඛණ වලින් ඇති ප්‍රයෝජන

- විගණන කාර්යය සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට උපකාරි වීම
- විගණන කාර්යය අධීක්ෂණයට හා සමාලෝචනයට උපකාරිවීම
- විගණන මතය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාපටිපාටි මඟින් ප්‍රතිඵල වශයෙන් ලැබෙන සාක්ෂි ලේඛණ ගත කිරීමට උපකාරි වීම

## කොතෙක් දුරට ලිපි ලේඛණ ගත කළ යුතුද ?

විගණක විසින් සලකා බලන සියලුම කරුණු ලේඛණ ගත කිරීම ප්‍රායෝගික නොවන බැවින් හා අවශ්‍ය නොවන බැවින් විගණක කාර්ය පත්‍රිකාවල තරම/ප්‍රමාණය විගණකගේ වෘත්තීමය විනිශ්චය මත තීරණය වේ.

මෙහිදි එම ව්‍යාපාරය සම්බන්ධයෙන් කිසිදු සම්බන්ධතාවයක් නැති වෙනත් විගණකවරයකුට පවා-

1. ක්‍රියාත්මක කරන ලද විගණන ක්‍රියාපටිපාටි වල ස්වභාවය කාළය හා තරම පිළිබඳව
2. විගණන ක්‍රියාපටිපාටි වලින් ලද ප්‍රතිඵල / සාක්ෂි පිළිබඳ
3. විගණනය තුලදී මතුවූ ගැටලු /එළඹි විනිශ්චයන්/ නිගමන පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි ආකාරයට කාර්ය පත්‍රිකා ප්‍රමාණවත් විය යුතුය.

## විගණන ලිපි ගොනු

| | |
|---|---|
| ස්ථාවර ලිපි ගොනුව | විගණකවරයාට එක් ගිණුම් කාල පරිච්ඡේදයකට වඩා නැතිනම් එක් විගණනයකට වඩා දිගින් දිගටම අවශ්‍ය වන්නා වූ තොරතුරු වාර්තා කර තබා ගන්නා ලිපි ගොනුව මින් අදහස් වේ. |
| ජංගම ලිපි ගොනුව | ප්‍රවර්තන වර්ෂයේ විගණනයට පමණක් අදාළ වන්නාවූ තොරතුරු ඇතුලත් කර විගණක පිළියෙල කරන්නාවු ලිපි ගොනු ජංගම ලිපි ගොනුව ලෙස හඳුන්වයි |